# ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන සඳහා උරුම කළමනාකරණ සැලැස්මක අවශ්‍යතාව පිළිබඳ විමසීමක්

(පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී විජයසුන්දරාරාමය ටැම්පිට විහාරය, මයුරාවතී ශ්‍රී බෝධිරාජ ටැම්පිට විහාරය, බෝධිරුක්ඛාම ටැම්පිට විහාරය ඇසුරෙන්)

පී.ඒ.වයි.ආර්. කුලතුංග*, තරිඳු මධූෂාන් පීරිස්, කේ.කේ.එච්. මල්ෂා ගුණවර්ධන, පී.ඒ. අයේෂා දිල්රුක්ෂි

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*gayryasantharuwan14@gmail.com

ප්‍රමුඛ පදඃ උරුම කළමනාකරණය, ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන, උරුම සංරක්ෂණය, සැලසුම් ක්‍රියාවලිය

## හැඳින්වීම

පුරාවිද්‍යා උරුම කළමනාකරණය යනු පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත උරුමයක් නිසියාකාර ව සැලසුම් කිරීම, ආරක්ෂා කරමින් අනාගත පරපුර සඳහා ඉදිරිපත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම වේ (ගුණවර්ධන, 2005, 15). ලංකාවේ ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන සඳහා මේ වන තුරු උරුමය කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාදාමයක් සිදු නොවේ. මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ ග්‍රාමීය පරිසරය තුළ උරුමය රැකීම පිළිබඳ සංකල්පය කොතෙක් දුරට ස්ථාපිත කල හැකි ද යන්න විමසා බැලීමයි. ඌන සාක්ෂරතාව මෙන් ම මිත්‍යා විශ්වාසයන් පිළිබඳව දක්වන කුතුහලාත්මක අවධානය උරුමයන් ග්‍රාමීය පරිසරයෙන් ඈත්වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගත හැකිය. ආගමික දැනුම ප්‍රචාරය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ග්‍රාමීය විහාරස්ථානයන් මෙහෙයක් සිදු කරයි. උරුමය රැකීම විශේෂඥයින්ගෙන් පහළට ගලා නොයන්නේ අධ්‍යයන හා ආගමික භාවය අතර ඇති අසමතුලිත භාවය නිසයි. මේ සංසිද්ධීන් පිළිබඳව ග්‍රාමීය පුරාවිද්‍යා ස්මාරකයට අයත්, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ශ්‍රී විජයමසුන්දරාරාමය ටැම්පිට විහාරය, මයුරාවතී ශ්‍රී බෝධිරාජ ටැම්පිට විහාරය, බෝධිරුක්ඛාම ටැම්පිට විහාර යන විහාරස්ථානයන් ආශ්‍රිතව සිදු කරන ලද පර්යේෂණයක දැනුම උපයෝගී කරගනු ලැබේ. තෝරාගත් උරුම මධ්‍යස්ථානයන් පිළිබඳව සමීක්ෂණයේ දී ගැමියන් මෙම විහාරහි ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව අවබෝධයක් නොමැතිවීම හේතු වී ඇත. උරුම කළමනාකරණ ක්‍රියාවලිය තුළ භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය ද උරුමය ආරක්ෂා කිරීමෙහිලා වැදගත් වේ. උරුම අයිතිකරුවන් දැනුවත් කිරීමකින් තොරව සිදු කරන ලද ඇතැම් සංරක්ෂණ විධික්‍රම අසාර්ථක වී ඇත්තේ පවත්වා ගෙන යෑමේ ඇති දුර්වලතාව නිසා බැව් පර්යේෂණයෙහි දී පැහැදිලි විය. මෙම පර්යේෂණය හරහා අනෙකුත් ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථානවලට උරුමය කළමනාකරණය සැලසුම් අවශ්‍යතාවය පවතින බව පෙන්වා දීමත් ඒවා සඳහා නිසි අවබෝධාත්මක දැනුම ස්ථාපනය කිරීමේ වැදගත්කම හඳුනා ගැනීමත් ප්‍රධාන අරමුණ වේ.

### ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් ආකාර දෙකක සාක්ෂ්‍ය සංස්පර්ශයක් කෙරෙහි අවධානය යොමු විය. ක්ෂේත්‍රය නිරීක්ෂණයෙන් ප්‍රමුඛ මූලාශ්‍ර පරිශීලනය හා අධ්‍යයනය දෙවනුව සිදු කරනු ලැබූ අතර පර්යේෂණ දිශානතිය තීරණය කිරීමේ දී සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීමේ ක්‍රමවේද වේ. තෝරා ගන්නා ලද ස්ථානයන් හි භෞතික පිහිටීම, හායනයේ ස්වභාවය, පිළියම් ප්‍රවේශ මාර්ග, නඩත්තු, භාවිතය මෙන්ම මෙන්ම උරුමයේ කළමනාකරණයේ අවශ්‍යතාව හඳුනා ගැනීම සඳහා විශේෂයෙන් ක්ෂේත්‍ර සමීක්ෂණය උපකාරී විය.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

උරුම කළමනාකරණයේ අරමුණු ලෙස සංස්කෘතික උරුම ස්ථාන නඩත්තුව ,සංස්කෘතික උරුම ස්ථාන අර්ථ නිරූපණය කිරීම, සංචාරකයා පිළිගැනීම හා ඔවුන්ගේ අවශ්‍යතා සපුරා දීම, පුරාවස්තු කෙලසීම හා අලාභහානි කිරීම වලක්වාලීම, සංචාරකයා කළමනාකරණය කිරිම යන ආදියයි (Schiffer, and George, 1997, 111). ඒ අනුව මෙම පර්යේෂණය තුළ ලැබුණු ප්‍රතිඵල අනුව ඉහතින් සඳහන් කර ඇති පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි පුරාණ ටැම්පිට විහාරය නිරීක්ෂණය තුල දී කිසිදු උරුම කළමනාකරණ සැලසුමක් දියත් කොට නැත. මෙයට ප්‍රධාන හේතුව වන්නේ මෙම පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ සාමාන්‍ය ප්‍රජාව තුළ දැනුවත්භාවයක් නොමැතිවීම යි. එමෙන්ම මෙවැනි පුරාවිද්‍යා ස්ථාන සඳහා අඩු සැලකිල්ලක් පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කරන ආයතන වලින් සිදු වී ඇත. මෙම හේතුව නිසාවෙන් මෙම ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන දිනෙන් දින විනාශයට ලක් වී ඇත. අදවන විට ලංකාවේ ඇති පුරාවිද්‍යා ස්ථාන වලින් සංචාරකයන්ගේ ආකර්ශනය යොමු වී ඇති ස්ථාන සඳහා උරුම කළමනාකරණ සැලසුම් තිබුණ ද ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන සඳහා එවැනි කිසිදු උරුම කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවේ. අවම වශයෙන් මෙම පර්යේෂණයට බඳුන් කරනු ලැබූ ශ්‍රී විජයසුන්දරාරාම ටැම්පිට විහාරය, මයුරාවතී ශ්‍රී බෝධිරාජ ටැම්පිට විහාරය, බෝධිරුක්ඛාම ටැම්පිට විහාරය 2008 න් පසුව කිසිදු සංරක්ෂණ ක්‍රියාවලියක් සිදු වී නැත. එම මේ වන විට ටැම්පිට විහාර ඉතා අබලන් තත්ත්වයට ලක් වී ඇත. මෙම ඇති සිතුවම් කොටසේ පතුරු ගැලවීම, වහලය අබලන් වීම මත විහාරයේ බිත්ති කැඩී ගොස් ඇති බව නිරීක්ෂණය තුළින් පැහැදිලි විය. එමෙන්ම මෙම ටැම්පිට විහාර නැරඹීමට එන මහජනයා විසින් ඇතුල් ගෘහය තුළ පහන් දැල්වීම නිසා සිවිලිමේ ඇඳ තිබූ සිතුවම් අවපැහැ ගැන්වීම සිදු වී තිබේ. ශිලා ටැම් ඇති කොටසේ විවිධ ලෑලි, දැව කොටස් දමා ඇත. මයුරාවතී ශ්‍රී බෝධිරාජ ටැම්පිට විහාරය , බෝධිරුක්ඛාම ටැම්පිට විහාරය ටැම් පිහිටි කොටස ගබඩාවක් ලෙස භාවිතා කිරීමට පුරුදු වී ඇති නිසා වේයන්ගේ ක්‍රියාකාරීත්වය නිසා ටැම්පිට විහාරයේ දැව තට්ටුව දීරා යෑමට ලක් වී ඇත. පසුගිය දශක කීපය තුළ පර්යේෂණ ලක් කර ඇති මෙම ටැම්පිට විහාරවල ඓතිහාසිකත්වයට අහිතකර ලෙස බලපෑම් කළ කරුණු ලෙස,

- දුර්වල නඩත්තුව
- නොගැළපෙන අලුත්වැඩියාව
- නොගැළපෙන ස්වරූපයේ හා පරිමාණයේ නව ඉදිකිරීම්
- නීතිවිරෝධී අව්දිමත් ඉදිකිරීම්
- යෝග්‍ය නොවන ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතය

යන ආදී කරුණු නිසා ද මෙම නිසා ද මෙම ටැම්පිට විහාර බලපෑම් ලක් වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම ටැම්පිට විහාර සඳහා නිසි උරුම

කළමනාකරණ සැලසුමක් නොමැති වීමයි. මෙම ටැම්පිට විහාර පමණක් නොව ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන වලට සිදු වී ඇත්තේ මෙම ටැම්පිට විහාරවල ලක් වී ඇති ඉරණමයි. බොහෝ ස්ථාන තරමක් දුරට හෝ ආරක්ෂා වී ඇත්තේ විහාරාධිපතිවරුන්ගේ ක්‍රියාකලාපයන් නිසාය. එනම්, බොහෝ ආගමික පුරාවිද්‍යා ස්ථානයන්ට සිදු වන හානිය අවම කිරීම සඳහා විහාරාධිපතිවරුන් එම ස්ථාන නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ. නමුත් එම නඩත්තු කටයුතු පුරාවිද්‍යාත්මක න්‍යායන්ට අනුකූල නොවූව ද ඒ හරහා උරුම ආරක්ෂා වී ඇත.

පර්යේෂණයට බඳුන් කරන ලද විහාරවල භෞතික තත්ත්වය පිළිබඳ අවධානය යොමු කරන විට විශාල වශයෙන් හායනයට ලක් වී ඇති බව දැකගත හැකි විය. මේ සඳහා මානව ක්‍රියාකාරකම් ප්‍රබල හායන කාරකය වී තිබේ. මෙය ප්‍රධාන හේතු වී ඇත්තේ මෙම උරුමයේ ඇති වටිනාකම, ඓතිහාසිකතවය, මහජනයා නොදැන ගෙන සිටීමයි. පරණ විහාර යැයි ආමන්ත්‍රණය කරන මොවුන් මෙහි ඇති වටිනාකම පිළිබඳ අවබෝධයක් නොමැතිකම හේතුවෙන් විවිධ ක්‍රියාකාරකම් මෙම ටැම්පිට විහාරය ආශ්‍රිතව සිදු කර ඇත. ග්‍රාමීය පරිසරයක ජීවත් වන මොවුන් මෙම ටැම්පිට විහාරය දෙස නෙත් යොමු කරනුයේ කුඩා විහාර ගෙයක් සහ, විහාරස්ථානය ආරම්භයේ ආගමික වතාවත් කිරීම සඳහා නිර්මාණය කර ඇති බවයි. ටැම්පිට විහාරය යනු කුමක් ද, මෙහි සිතුවම් හා වාස්තු විද්‍යාත්මක අතින් වැදගත් උරුමයක් පවතින්නේදි?, යන්න ඔවුන් නොදැනී. මේ නිසාවෙන් උරුම කළමනාකරණ ක්‍රියාවලිය තුළි දී උරුමයේ ඇති වටිනාකම පිළිබඳ මහජනයාට අවබෝධකර දීම සිදු කළ යුතු බව මෙහි දී තහවුරු විය. ඔවුන්ගේ මනසේ ඇති මෙම විහාරය සම්බන්ධ දෘෂ්ඨිය සංකල්පමය වශයෙන් වෙනස් කර යුතුය. ඒ සඳහා දිගු කාලයක් ගත වනු ඇත. එම නිසාවෙන් උරුම සැලසුම් ක්‍රියාවලිය තුළදී වාර්ෂික කළමනාකරණය තුළ මූලික කාරණය වූයේ උරුමයේ වටිනාකම, ඓතිහාසිකත්වය මහජනයාට වටහා දීම සිදු කල යුතු බව යි. උරුම කළමනාකරණ ක්‍රියාවලිය තුළ වැදගත් වන අංගයක් වූයේ උරුමයේ වැදගත් කම හා වටිනාකම පිළිබඳ අවබෝධය ලබා ගැනීම හා ඒ අයුරින් සැලසුම් ක්‍රියාවලිය නිර්මාණය කිරීමයි. සැලසුම් ක්‍රියාවලියේ දී පුරාවිද්‍යා ස්ථානය වාර්තා ගත කිරිම ඉතා වැදගත් කාර්යයකි. එයට හේතුව අතීතයේ පැවැති ආකාරයට වර්තමානය වන විට උරුමය නොපවතිනි හෙයින් වර්තමානයේ පවතින තත්වය පිළිබඳ වාර්තා ගත කිරීම අනිවාර්ය වේ. මෙම සමස්ත පර්යේෂණ තුළ දී තහවුරු වූයේ පුරාවිදයා ස්ථාන ආරත්ෂා කිරීම සඳහා උරුම කළමනාකරණ සැලසුමක් අවශ්‍ය බවයි. එය ප්‍රධාන පුරාවිද්‍යා ස්ථානවලට පමණක් සීමා නොවී ග්‍රාමීය පුරාවිද්‍යා ස්ථාන සඳහා උරුම කළමනාකරණ සැලසුම් ක්‍රියාවලක අවශ්‍යතාවය පවතින බවය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අනුරාධ, ආර්. කේ. එස්., කුමාරි, සමන් අජන්තා (2015) ***පෞරාණික ස්ථාන හා ස්මාරක.*** කුරුණෑගල දිස්ත්‍රික්කය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ගුණවර්ධන, පි. (2005) ***පුරාවිද්‍යා උරුමය, ආකෘති, සංකල්ප සහ කළමනාකරණ.*** ජා ඇලඃ සමන්ති ප්‍රකාශකයෝ.

Schiffer, Michael. B., and George J.Gumerman (1997) eds. **Conservation Archaeology: A Guide for Cultural Resource Management Studies.** New York: Academic Press